

## මේනකා

උලුක්කුව වළලුකර තවනකොට
සපත්තුව, අත් පපුවෙ ගසනවා.
පරක්කුව ඉක්මන්ද
ඔරොප්පුව සන්සුන්ද
තුවක්කුවකින් වචන ගලනවා.

කරුවලෙත් එළිය මුණ ගැහෙනකොට
තරුවලත් වේදනා
දරුණු ඇස් සෙනෙහසින් පිරෙනකොට
කරුවලයි මේනකා,

රැය තවම තරුණ බව ඇත්ත
ඉක්ම ගිය මොහොතමය, මත්ත
සඳ ලිහන මුහුලසෙහි තිත්ත
ඔබ ඔබෙ ම හදවතින් ගත්ත.

පිනි බිඳක්
කොපුළ මත නාටකා
ඇඟිලි තුඩ
අරගන්න මේනකා.

අත ඉරුණු හැට්ටය
හරි හැඩයි
නෙත දවන දිට්ටිය
බැති වඩයි.
අත හැරුණු වට්ටිය
මල් ඉසියි
කට කැඩුණු මුට්ටිය
බත් පිසියි

හිතක් පපුවක් නැති හුළගට
කවිත් ලියන්න පුළුවනි
අතක් බිඳ වෙලුම්පටි වෙල වෙල
හිසත් සිඹින්න පුළුවනි
ඇසක් යට පිරිත් පැන් ඉහිරන
විරිත් තියෙන්න පුළුවනි
බසක් නැතියෙන් තෙතක් උහුලන
තිතත් තියන්න පුළුවනි.

අමු මිරිස් පෑ රැගත් තාරුකා
දැවිල්ලයි ඇස් දෙකට
සමු අරන්, නවතිද්දි, මේනකා
නිවිල්ලක් නෑ හිතට.

ප්‍රේමයේ නිශ්ශබ්දකම් බින්ද
මේ රැයේ ඉස්මත්ත කවුරුන්ද?

මංජුල වෙඩිවර්ධන

## චූටි දූ

සුරඟනක් තොටිල්ලේ
සුව නින්දෙ සිරි විඳියි
රස සිහින බල බලා
හීනියට සිනහ වෙයි

සිඟිති අත් පා කැකුළු
දිග හරී හිරි හරියි

සුර ලොවේ සිට ඇවිත
මුළු ගෙපැල එළි කළේ
කිරි සිනා පෙර පෙරා
සිරී දූ කැදෙව්වේ

වම් පදවි පිය පදවි
කිරුළු ගෙට ගෙනත් දී
රස ගුලාවක් මැවූ

චූටි දූ ගැවීනා
මේ කවිය ඔබටම ය

ප්‍රසාදිනී වෙත්තසිංහ
මිල්පාක්

## සැන්දෑවේ ගීතය

ඇසේලියා මල් පඳුරක
පෙති ගිලිහී නටු තනිවම
තණ පත් මත නටන සුළඟ
වියලි සිහිනයකි දහවල.

-පිපුනු මලක් ලහිරු රැසක්
සිත නොපුරයි-හද නොරඳයි
සසල මනස තව කළඹයි-

නිල්වන් දුර අහස් ගැබේ
ඈත ඈත හිඳ තරුකැට
දුබල නෙතින් හිනැහෙන විට
යළි හමුවන බව නොකියා
සමුගන්නා පෙමක් විලස
පෙලනු දැනේ මා තනිකම.

-පිපුනු මලක් ළහිරු රැසක්
සිත නොපුරයි-හද නොරඳයි
සසල මනස තව කළඹයි-

චන්ද්‍රිකා ද සිල්වා

## නොපැවැත්මක ඒකාත්මය

සුභද්‍රා ජයසුන්දර

ඔහු බුද්ධ
දුක දිනා ප්‍රඥාව පිහිටුවා
අග්නි සමග ම ජලය මවන්නේ
සූර්යයා වී අසිරි ගෙනෙන්නේ

පුතුන් දුන් ඈය මවකි
නින්දාව දරන්නී
කිඹුල්වත වස්සාන නුරාවේ
පතුල් පහස ම ලබා සැණසෙමින්
අවතැන් වු පුරා සඳ වලප්නී

දිය ද ගින්න ද දෙමින් ඔහු ඇයට
නිවී සැන්නහෙන්න යැයි දෙසුවාද

අනුරාග රඟ රඟන
අනුරාග ශිව සිරස
ගිණි ගන්න දිය රැදේ
දියවෙනා ගිණි සමඟ
ප්‍රතිවිරෝධය ප්‍රභා මණ්ඩලය
සිත් පෙලන දේවතා වරයක් ය

මෑදු බවට ගිණි තියා
පාර්වති හද දවා.......
දැවෙන හද පුන් සඳක පැහැය දැක
දිය ඉසියි ශිව නැවත අතර මැද

නියතයක් විලාසෙන් ලැව් ගින්න
අමර,යව රැඳුණු කල්පයක
කිහිරඟුරු මත කුසුම් පළඳවන
මේ නියත සෘතුවයි නුඹ පැමිණ

අලු මතින් ජීවිතය සදන්නට
හිරු එළිය සමගින් ම වැසි ඒ ය

මල් රෙහෙණු යලි දැවෙණු පෙරාතුව
නුරා දී රඟන්නට රේණුවට
සහස් මොණරුන් සඇස් ඇහැරවා
කුසුම් මේ නිමේෂය.......
නිමේෂයකට උනත් එල ගන්න

ජලය මතුපිට අග්නි රඳවන්න
බුදුන් දෙවියන් නුඹට කුමකට ද
නග්න දෑසක විදුලි රේඛාව
නුඹ වෙතින් නුඹ වෙත ට හරවන්න

නම නොදත් වර්ණයම
ඉන්ද්‍රචාපය වේද
නො පැවැත්ම පැවැත්ම ම කරගන්න
නිමේෂය සදාකාලික වේද

# පහන් වැට

## පාලුව

සීත  හිම වැටෙනා වෙලේ
ඒ සොඳුරු දැකුමේ....
පාලුවේ සිටිනා.........මගේ සිත
ඔබ ළඟයි රැඳුණේ......
වසර ගණනාවක් පුරා,
නුදුටුවත් ඔබ
ඊයෙ වගෙමයි මගේ මතකය,
ඔබට මතකද දන්නෙ නෑ
මගෙ සිතම පාලුයි.
මුලු සිතම පාලුයි.
කියාගන්නට සෙනෙහසක් ගැන
සිතේ දිරියක් නෑ...........
මගේ සෙනෙහස තාම එහෙමයි
කිසිඳු වෙනසක් නෑ
මගේ සිතතුල මෙලෙස තෙරපෙන්නේ
ආදරේමද? අනේ මම දන්නෑ.

අසෝකා දේවසුරේන්ද්‍රා
ප්‍රංශය

## මිලින කුසුම

සිත දවන මොහොතක
සිතිවිලි පදවලට හැඟීමට
කිවිඳියක නොවෙමි මම
පද වැල් ගොතා අමුණන

හදේ උණුසුම්ම තැන
ඔබට පුද දුනිමි මම
පූජාසනය මත තබා
පුද දෙන කුසුමක විලස

කාලයේ ඇවෑමෙන්
වෙනස් වන සුළු ලොවක
මගේ සෙනෙහසද ඔබට
මිලින වූ කුසුමක් ම විය

මහද කුසුමේ පෙති කඩා
පොඩි කර ඔබ නික්ම ගියද
ඔබේ රුව සුවඳ තැවරුණු
හිත තාම උණුසුමයි පෙර තරමටම

සුභාෂිණී බුද්ධසිරි
බෙරික්



## උනාගල වෙහෙර අබියස

නිරාෂ ගුණසේකර

වැලි මලුව සිතුවම් කළ
කෝටියක් පා ලකුණු එඬදවස
කාලයේ දූවිලි තවරගෙන
අවසන් සාධුකාරයට සැරසෙන
මරණාසන්න අරලිය මලෙක
පරමල් හිනා ඇවිලෙන

දොරණ තෙල් පුසුඹ වියැකී
දුඹුළු පුස් ගඳ ම සුවඳ වුණු
ගොළු නිහඬ වෙහෙර ගෙය
මහා ඝෝෂාවක් ම විය

එඬඅසල දිරූ පැදුරු කෙටියක
එරමිණිය ගොතා ගෙන හිඳින
වැහැරුණ හිමිනමක් එකඬමෙක
ගනියි නවගුණවැල උපශාන්ත ව

නුදුරේ හිස් පාත්තරයට
හිස පොවා ඉවකරන
කලූ කෙට්ටු පුරු පුරු බළලෙකු
අසල ම එඬහිමි තනියට

ලැහැබ ඔබ්බෙහි සුදු මහත
අලුත් සෑ ලද පන්සලට
දන්න හඳුනන දායක කැළ
පිට පාරේ ම සක්මන් කරන

පැරණි පුස්කොළ පොතේ
අක්ෂරය වනපොත් කරනාඬතර ම
මැදුම් බැල්මක් ලන උන් දෙස
වැහැරුණු කෙට්ටු හිමිනම